යම් කිසි පුවතකට සිරස්තල යෙදීමේදී අඩු වචන ප්‍රමාණයකින් නිර්මාණශීලීව අදහසක් ලබාදීමට ඇති අයිතියට එරෙහි විය නොහැක. කෙසේ නමුත්, එසේ සිරස්තල යෙදීමේදී පුවත් වාර්තාවේ අදහස නිවැරදිව නොලැබෙන අවස්ථාවන්, යම් කිසි අපරාධයක තොරතුරු සැහැල්ලු කොට දැක්වෙන අවස්ථාවන් මෙන්ම සිරස්තල භාවාතිෂය වන අවස්ථාවන් සම්බන්ධයෙන් සිරස්තල යොදනා කතුවරයා හෝ මාධ්‍යවේදියා ප්‍රවේසම් විය යුතු නොවේ දැයි පාඨක අප විමසිය යුතුයි.

මන්දයත්, සිරස්තල භාවාතිෂය වන විටදීත්, සිරස්තල ඔස්සේ සිදුවීම සැහැල්ලු කොට දැක්වෙන විටදීත් සිදුවීමේ බරපතළකම සහ සියුම් තොරතුරු පාඨකයාට ග්‍රහණය නොවී යෑමට ඉඩ ඇති බැවිනි.

ඒ අනුව, කාන්තාවකගේ නිරුවත් ඡායාරූප බෙදාහැරීමේ වරදට අත්අඩංගුවට ගැනුණු සැකකරුවෙකු සම්බන්ධයෙන් දැක්වෙන පහත පුවත් සිරස්තල තුළින්, ඔබ තෝරා ගන්නා සිරස්තලය කුමක්ද?

1) අනියම් පෙමේ රහ තැන් මිතුරන්ට පෙන්නූ තරුණයාට ඇප

2) අනියම් පෙම්වතියගේ නිරුවත් ඡායාරූප මිතුරන්ට බෙදාහැරි තරුණයාට ඇප